**ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2276 - එස්ආර්අයි) - 2014**

---

**ද්විතීයික** නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹී ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සහ 2007 ජුනි 06 දිනැති අංක 2276 එස්ආර්අයි දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

**ද්විතීයික** නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නියෝජිතායතනය වේ. උතුරු මැද පලාතේ සහ ශ්‍රී ලංකා රජයේ නාගරික ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශ පහක 969,000 ක් වන ජනතාවට සුරක්ෂිත ජලයද 171,500 ක් වන ජනතාවට සනීපාරක්ෂාවද සැපයීමත් ජල කේන්ද්‍රික ආයතන සවිබල ගැන්වීම මගින් සුරක්ෂිත ජලය සැපයීමේ ධාරිතාව වැඩිකිරීමත් ව්‍යාපෘතියේ අරමුණු වේ. 2003 අගෝස්තු 18 දිනැති අංක 1993 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත රු.මිලියන 5,803 කට සමාන එජඩො මිලියන 60.29 ක් ආසියානු සංවර්ධන බැංකුව මූලිකව ප්‍රතිපාදනය කර තිබුණු අතර එහි මූලික ශාක්‍යතාවේ සිට බරපතල මිල වැඩිවීම හේතුවෙන් ඉහත අරමුණු ලඟා කර ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව අතුරු ණය අංක 2276 එස්ආර්අයි අනුමත කර තිබුණි. අතුරු ණය ගිවිසුම අනුව, රු මිලියන 6,889 කට සමාන එජඩො මිලියන 63.24 ක් ව්‍යාපෘතියේ මූලික ඇස්තමේන්තු මුළු පිරිවැය වූ අතර එයින් රු.මිලියන 4,336 කට සමාන එජඩො මිලියන 39.81 ක් එනම් සියයට 63 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇති අතර එයින් රු මිලියන 2,552 කට සමාන එජඩො මිලියන 23.43 ක් එනම් සියයට 37 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. පිරිවැය ඉක්මවා යාමේ ප්‍රතිඵලයක් ලෙස, ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කළ ඇස්තමේන්තු වටිනාකම රු මිලියන 5,323 කට සමාන එජඩො මිලියන 48.80 ක් දක්වා වැඩිකර තිබුණු අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු මිලියන 4,568 කට සමාන එජඩො මිලියන 41.87 ක් දක්වා වැඩිකර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජූනි 30 දින අවසන් කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාලය 2014 ජූලි 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරේක වෙන්කිරීම වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව සහ

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

2014 දෙසැම්බර් 31 දිනට විදේශ විනිමය උච්චාවචන සංචිත ගිණුමේ වූ රු.67,654 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ අයෝග්‍ය ලෙස දක්වා තිබුණි.

**2.2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පණතේ 21 වන වගන්තිය හා 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) හී ඡේද අංක 05 අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද වටිනාකම රු. මිලියන 38 ක එකතු කළ අගය මත බදු (වැට්) ගෙවීම් පිළිබඳ මාසික වාර්තාවක් විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු. මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් බාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩර පිරිනැමීමෙන් පසු ටෙන්ඩර් ගිවිසුම දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල නියුතු කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍යතාවයන් අනුව, ව්‍යාපෘතියේ ගණුදෙනු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

ව්‍යාපෘති වාර්තා අනුව, පාෂාණ ද්‍රව්‍ය ඝන මීටර 7,905 ක් කැණීම් කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 57.8 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් එම පාෂාණ ද්‍රව්‍ය ව්‍යාපෘති කටයුතු වලට භාවිතා කළ බවට හෝ විකුණු බවට තහවුරු කර ගත හැකි කිසිදු සාක්ෂියක් විගණනයට ලබා ගත නොහැකි විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ආ.සං.බැ. | 48.80 | 5,323.00 | - | - | - | 48.80 | 5,490.94 |
| ශ්‍රී.ලං.ර | 41.87 | 4,568.00 | 170.00 | 1.26 | 166.25 | 37.60 | 4,295.11 |
| එකතුව | 90.67 | 9,891.00 | 170.00 | 1.26 | 166.25 | 86.40 | 9,786.05 |

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, හම්බන්තොට, මඩකලපුව හා මුතූර් දිස්ත්‍රික්කවල නල එලීම, ජල පිරිපහදු යන්ත්‍ර සහිත ජල කුළුණු සහ වැසි ජල ප්‍රවාහනය වැඩි දියුණු කිරීම් කටයුතු ආදී කොන්ත්‍රාත් හතරක් එජඩො මිලියන 63.24 ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය ආරම්භයේදීම අපේක්ෂිත විය. කෙසේ වෙතත් පසුව කොන්ත්‍රාත් 04 හි මුළු පිරිවැය ඇස්තමේන්තුව එජඩො මිලියන 90.66 ක් ලෙස සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය යටතේ සියළුම කොන්ත්‍රාත්තු 2013 අප්‍රේල් 30 වන විට සම්පූර්ණ කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මඩකලපු දිස්ත්‍රික්කයේ ආරම්භ ස්ථානීය වැඩ, පිරිපහදු නොකළ ජල සම්ප්‍රේෂණය, පිරිපහදු යන්ත්‍ර සහිත ජල කුළුණු සහ ජල නල සැපයීම් හා එලීම් වැනි ඉදිකිරීම්වල නියුතු කොන්ත්‍රාත් කරුවන් විසින් සිදු කළ හිමිකම් ඉල්ලීම් ව්‍යාපෘතිය පියවා තිබුණු අතර රු. 11,336,247 ක ප්‍රමාද ගාස්තු වටිනාකමක් ඒ සමග ගෙවා තිබුණි.

(ආ) ජී.ඒ.සී. පෙරුම් මාධ්‍ය ඝණ මීටර 1,720 ක් සැපයීම සඳහා 2011 ජුනි 23 දින එජඩො 1,165,736 ක් සහ රු. 4,293,757ක් ව්‍යාපෘතිය ගෙවා තිබුණු නමුත් 2014 සැප්තැම්බර් 30 දින වනවිටත් කොන්ත්‍රාත්කරු විසින් ඝන මීටර 1,315.6 ක් පමණක් සපයා තිබුණි. තවද 2014 සැප්තැම්බර් 29 දින එයින් එජඩො 364,825 ක් සහ රු. 1,343,761 ක් අඩු කර තිබුණි.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

--------------------------------

කොන්ත්‍රාත්කරුවකු හට 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. මිලියන 62 ක් ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් පියවීමට අපේක්ෂිත අතර භාණ්ඩාගාරය විසින් එය තහවුරු කර නොතිබියදීත් ඒ වෙනුවෙන් ගිණුමවලට ගැලපීම් සිදු කර තිබුණි.